**සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම 2016/ 2017**

---

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තිය ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 සමාගම පිහිටුවීම

---

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම 1872 සමාගමක් ලෙස ලියාපදිංචි කර 1872 වර්ෂයේ සිට 1976 වර්ෂය දක්වා ශතවර්ෂයකට අධික කාලයක් මහා බ්‍රිතාන්‍ය පාලනය යටතේ සිදුකරන ලදී. 1971 අංක 35 දරන ව්‍යාපාර පවරා ගැනීමේ පනත යටතේ 1976 රජයට පවරාගත් අතර සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම නමින් නිසි බලධාරියෙකු යටතේ ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යන ලදී.

1987 අංක 23 දරන රජයට පවරා ගත් ආයතන පොදු සමාගමක් බවට පත්කිරීමේ පනතින් රාජ්‍ය සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී. 1994 රජයේ ප්‍රතිපත්තියට අනුව පෞද්ගලීකරණය කර ඇති අතර 1996 අංක 29 දරන රාජ්‍ය ව්‍යාපාර පුනරුත්ථාපනය කිරීමේ පනත යටතේ 1997 දී නැවත පවරා ගෙන රේඛීය අමාත්‍යාංශ අධීක්ෂණ යටතේ පාලනය වෙමින් පවතින අතර වර්තමානයේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලෙස ලියාපදිංචි කර තිබුණි.

**1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2017 මාර්තු 31 දිනට සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

---

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය හා සීමා කිරීම් පහත දක්වා ඇති පරිදි වේ.

(ආ) - විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02**

---

(i) මූල්‍ය ප්‍රකාශනවල මුළු තොග සම්බන්ධයෙන් හෙළිදරව් කළ යුතු පහත කරුණු අනාවරණය කර නොතිබුණි.

* තොගවල මුළු ධාරණ අගය හා අස්ථිත්වයට උචිත වන වර්ගීකරණය අනුව ධාරණ අගය,

* සාධාරණ අගයෙන් විකිණීම සඳහා යන වියදම අඩුකල පසු වටිනාකමට පෙන්වන තොගවල ධාරණ අගය

* කාලපරිච්ඡේදයේ වියදමක් ලෙස හඳුනාගත් තොගයේ වටිනාකම

(ii) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.2,245,769,383 ක් වූ තොගය තුළ ඇතුළත් භාවිතයට ගත නොහැකි වසර 5 ඉක්මවූ වටිනාකම රු.12,796,873 ක් වූ මෙට්‍රික් ටොන් 695,998 ක පොහොර තොගය සම්බන්ධයෙන් හානිකරණ අලාභ ගැලපීම් සිදුකර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

---------------------------------

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.38,318,368 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ, ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2. ගිණුම්කරණ ප්‍රතිපත්ති**

--------------------------

මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 3.5.1 අනුව අවසාන තොග මැනීම, ‘‘පෙර ඇතුළු පෙර නිකුත් කිරීමේ ක්‍රමය’’ අනුව(First in First Out) සිදු කළ බව දක්වා තිබුණද , පසු ලැබුණු පෙර නිකුත් කිරීමේ ක්‍රමය (Last in First Out) අනුව තොග මැනීම සිදු කර තිබුණි.

**2.2.3. ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ දේපළ පිරියත උපකරණ මිලදී ගැනීම් වෙනුවෙන් ගෙවා තිබුණු රු.441,480 ක අත්තිකාරම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන සංචලනය යටතේ දැක්වීම වෙනුවට මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා මුදල් ගලායාමක් ලෙස දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළව ආයතනය විසින් සිදුකළ බදු ආගණනයට අනුව බදු වගකීම රු.31,015,338 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල 17.1 සටහන අනුව වර්ෂයේ බදු වගකීම රු.18,493,956 ක් ලෙස දක්වා තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ වගකීම් රු.12,521,382 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනතට අනුව බදු වගකීම ගණනය කිරීමේදී වර්ෂයේ ගලපන ලද අලාභය වන රු. 51,337,088 වෙනුවට රු. 17,967,981 ක් සටහන් කිරීම හේතුවෙන් බදු වගකීම අධිගණනය වීමක් සිදු වී තිබුණු අතර අලාභය නිවැරදි ලෙස අඩුකර ගණනය කළ විට වර්ෂයේ බදු වගකීම රු. 23,430,143 කි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති බදු වගකීම රු.4,936,187 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**2.2.4. විගණනය සඳහා සාක්ෂි නොවීම්**

**--------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.2,245,769,383 ක් වූ තොගයෙහි ඇතුළත් රු.1,776,845,021 ක් වූ මධ්‍යම ගබඩාවේ පැවති තොගය සඳහා භෞතික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) සමාගම විසින් රාජ්‍ය බැංකුවකින් ලබාගන්නා ලද ණය ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු.13,501,929,683 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එම ශේෂය සනාථ කර ගැනීම සඳහා යවන ලද ලිපියට පිළිතුරු ලෙස භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ණය ගිවිසුම් සඳහා සෘජුව මැදිහත් නොවන බව තහවුරු කර තිබුණි.

**2.2.5. ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

**----------------------------------------------------------**

ණය පදනමට පොහොර ලබා දීමේදී ණය සීමාව ඉක්මවා අවස්ථා 5 කදී රු.4,044,135 ක වටිනාකමින් යුතු පොහොර ලබාදී තිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**--------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂ තුළ ඇතුළත් දැනට සේවයෙන් ඉවත් වී ඇති සේවකයන් 06 දෙනෙකු වෙත 2012 වර්ෂයේදී ලබාදෙන ලද රු.65,000 ක ණය ශේෂ මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර නොතිබුණි.

(ආ) ආයතනයේ ලියාපදිංචි නොවූ විකුණුම්කරුවන් වෙත චෙක්පත් ලබාගෙන පොහොර විකිණීමේදී, එම චෙක්පත් උපලබ්ධි වීමෙන් පසු පොහොර නිකුත්කිරීම සිදුකළ යුතු වුවත් ඊට පටහැනි ලෙස ප්‍රාදේශීය ගබඩා සහායකවරයෙකු විසින් චෙක්පත් උපලබ්ධි වීමට පෙර 2011 හා 2016 වර්ෂවලදී පොහොර නිකුත් කර තිබුණු පුද්ගලයින් දෙදෙනෙකුගෙන් 2017 මාර්තු 31 දින වන විට තවදුරටත් අයවිය යුතු එකතුව රු.724,505 ක් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) ලැබිය යුතු ශේෂ තුළ ඇතුළත් වසර 23කට වඩා පැරණි එකතුව රු.23,630,939 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) 2016 අප්‍රේල් 25 දින ගෙවන ලද සුබෝපබෝගී අර්ධ සුබෝපබෝගී ද්විත්ව කාර්ය බදු සඳහා දඩ ලෙස රු.81,000 ක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇතත් එම මුදල ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ගෙවන බවට කිසිදු ලිඛිත තහවුරුවක් නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

------------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම් |
| --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මුදල් රෙගුලාසි 371 හා හා 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ▪ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නොපියවූ අත්තිකාරම් ලෙස දක්වා ඇති රු.289,918 ක තුළ 2013 වර්ෂයේ සිට පැවත එන රු.91,215 ක් ශේෂයක් වන අතර ඒවා නිරවුල් කර නොතිබුණි.<br>▪ යම්කිසි කාර්යයක් සඳහා දෙන ලද අත්තිකාරම් කාර්ය නිමකල විගස පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 05 කදී රු.105,000 ක අත්තිකාරම් දින 20 සිට දින 72 දක්වා ප්‍රමාදවී පියවා තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 387 | රජයේ බැංකු ගිණුමකින් අයිරා ගැනීම තහනම් වුවද සමාගම විසින් රජයේ බැංකු ගිණුමකින් සමාලෝචිත වර්ෂයෙදී රු.156,595 ක බැංකු අයිරා ලබාගෙන තිබුණි. |
| (ආ) | 2002 මැයි 24 දිනැති අංක පීඑෆ්/පීඊ/21 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

------------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵල රු. 56,799,204 ක ලාභයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ලාභය රු. 180,971,671 ක් විය. එය ඉකුත් වර්ෂ හා සැසඳීමේදී රු.124,172,467 ක අඩුවීමක් නිරීක්ෂණය විය. ආදායම රු.1,015,047,494 කින් අඩුවීම ඉහත අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012/2013 වර්ෂයේ දී රු.123,182,724 ක් වූ බදු පසු ලාභය විචලනය වෙමින් පැවති අතර 2016/2017 වර්ෂයේ රු. 56,799,204 ක් දක්වා අඩු වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට රජයට ගෙවූ බදු, සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් නැවත ගැලපීමෙන් පසු 2012/2013 වර්ෂයේ දී රු.236,461,160 ක් වූ සමාගමේ දායකත්වය 2014/2015 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණ ද 2015/2016 වර්ෂයේ රු.353,446,651 දක්වා අඩු වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු. 171,729,158 ක් දක්වා තවදුරටත් අඩු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

---------------

පොහොර, රසායන ද්‍රව්‍ය, ඛනිජ ද්‍රව්‍ය හා වෙනත් ස්වභාවික හා කෘතිම ද්‍රව්‍යයන් නිමි හා නොනිමි ස්වරූපයෙන් එකී ද්‍රව්‍ය නිෂ්පාදන සඳහා වෙනත් අමුද්‍රව්‍ය, ඒජන්තවරුන්, ආනයනකරුවන්, අපනයනකරුවන්, බෙදාහරින්නන් හා වෙළෙන්දන් ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යාමත්, ඒවා ප්‍රති අපනයනය කිරීම පොහොර නිෂ්පාදනය සඳහා අවශ්‍ය රසායන ද්‍රව්‍ය හා අනෙකුත් අමුද්‍රව්‍ය ඕනෑම ස්වරූපයකින් පොහොර අපනයනය කිරීමත්, නියෝජිතයන් ලෙස ක්‍රියාකිරීම සහ ආනයන අපනයන ඇසුරුම් කටයුතු සිදුකිරීම සාංගමික ව්‍යවස්ථාවලිය අනුව සමාගමේ අරමුණ වේ.

අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ වී වගාව ප්‍රධාන බෝගයක් වීම නිසා රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස 2006 වර්ෂයේ සිට 2016 පෙබරවාරි 28 දින දක්වා කිලෝ 50 ක පොහොර මිටියක් රු.350 ක සහනදායී මිලකට ගොවියාට මිලදී ගැනීමට අවස්ථාව සලසා තිබුණු අතර එම සහනාධාර වැඩසටහනෙන් සියයට 35 ක අවශ්‍යතාවය සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් ඉටු කරන ලදී.

(ආ) 2016 මාර්තු 01 දින සිට පොහොර වෙනුවට මුදල් සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. එය පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය තුළ යූරියා, එම්ඕපී, ටීඑස්පී (Urea, Mop, Tsp) යනාදි සෘජු පොහොර වර්ග හා මිශ්‍ර පොහොර අලෙවියෙන් රු.බිලියන 5.69 ක් ලබාගැනීමට ඉලක්ක කර තිබුණද තත්‍ය අලෙවි ආදායම රු.බිලියන 0.82 ක් විය. ඒ අනුව ලඟාකර ගත හැකිවූ අලෙවි ආදායම සියයට 14 ක් වූ අවම මට්ටමක පැවතුණි.

(ඇ) සමාගම විසින් අනාගත ව්‍යාපාරික අවධානමට මුහුණදීම සඳහා සමාගම විසින් පූර්ව සැලසුම් පිලියෙළ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. SWOT විශ්ලේෂණය (Strengths and weaknesses in the organization and the external tiers and opportunities) හා ප්‍රමුඛතා ලබා දීම තුළින් විකුණුම් වර්ධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

සමාගම විසින් පොහොර ගබඩාවක් ඉදිකිරීම සඳහා මහවැලි අධිකාරියට අයත් ඉඩමක් 2012 වර්ෂයේ සිට බදු ගෙන ඒ සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම රු.779,700 ක මුදලක් වියදම් කර ඇතත් විගණන දිනය වූ 2017 ඔක්තෝබර් 30 වන විටත් ඉදිකිරීම් කටයුතු සිදුකර නොතිබුණි.

### 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආර්ථික සේවා ගාස්තු පනතට අනුව 2016 අප්‍රේල් 01 වැනිදායින් පසු ඕනෑම ව්‍යාපාරයක පිරිවැටුම බදු ගෙවිය යුතු සීමාවට ලඟා වූ විට (කාර්තුවක පිරිවැටුම රු.මිලියන 50 ක් වන්නේ නම් 2017 මාර්තු 31 දක්වා) ආර්ථික සේවා ගාස්තු සඳහා ලියාපදිංචි විය යුතු විය. එහෙත් සමාගම එසේ ලියාපදිංචි වී නොතිබීම හේතුවෙන් 2016/2017 වර්ෂයේ ආර්ථික සේවා ගාස්තු රු.4,202,453 ක් රජයට අහිමි වී තිබුණි.

(ආ) 2002 අංක 14 දරන (සංශෝධිත) එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ 2 වන කොටසේ අයිතම (a)(x) යටතේ පොහොර ආනයන සහ සැපයීම පමණක් එකතු කළ අගය මත බදුවලින් නිදහස් වුවද, එකතුව රු.3,279,501 ක් වූ කුලී ලැබීම්, අබලි ද්‍රව්‍ය විකුණුම් හා විවිධ ආදායම්, එකතු කළ අගය සඳහා බදු ගණනය කිරීමේදී සැළකිල්ලට ගෙන නොතිබුණි.

**4.4 හඳුනා ගන්නා ලද පාඩු**

---------------------------

2006 අංක 10 දරන දේශීය ආදායම් පනත, ජාතිය ගොඩනැගීමේ බදු හා උපයන විට ගෙවීම් පනත් ප්‍රකාරව නියමිත දිනවලදී බදු මුදල් නොගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ සමාගම විසින් එකතුව රු 2,588,918.ක දඩ මුදලක් ගෙවා තිබුණි.

**4.5 කාර්ය මණ්ඩල කළමනාකරණය**

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිණුම් වර්ෂය අවසානයට සමාගමේ අනුමත සේවක සංඛ්‍යාව 151 ක් වුවත් තථ්‍ය සේවක සංඛ්‍යාව 135 වූයෙන් පුරප්පාඩු තනතුරු 27 ක් හා අතිරික්ත තනතුරු 11 ක් පැවතුණි. මේ අතුරින් අතිරික්ත තනතුරු 9 ක් අදාළ තනතුරුවලට පමණක් සීමාවන බව සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

(ආ) සමාගම් ලේකම්වරයකු ලෙස සේවය ලබාගත හැකි සුදුසුකම් සහිත නීති නිලධාරියෙකු ආයතනයේ ස්ථිර සේවයේ නියුතුව සිටියදී සමාගම් ලේකම්වරයෙකු ලෙස 2016 පෙබරවාරි 28 දින බාහිර පුද්ගලයෙකු බඳවාගෙන ඒ සඳහා 2016/2017 වර්ෂය වෙනුවෙන් රු.219,050 ක මුදලක් ගෙවා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-----------------------------------------------

**5.1 අයවැය ලේඛනමය පාලනය**

--------------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ගත අයිතම 53 ක අයවැයගත හා තත්‍ය ආදායම් සහ වියදම් අතර සියයට 21 සිට සියයට 368 දක්වා විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සමාගමේ සභාපතිවරයා වෙත යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) මූල්‍ය පාලනය | (i) | කාලපරිච්ඡේදය තුළ සිදු කරන ලද ණයට විකුණුම් හා මුදලට විකුණුම් , ආපසු එවුම් පිළිබඳ තොරතුරු ලබාගැනීමට හැකි පරිදි ගිණුම් නඩත්තු කර නොතිබීම. |
| | (ii) | විධිමත් මුදල් පොතක් නඩත්තු නොකිරීම හා බැංකු සැසඳුම් කාලීනව පිළියෙල නොකිරීම. |
| (ආ) විකුණුම් පාලනය | | ආපසු ගෙවීමේ හැකියාව පරීක්ෂා කිරීමකින් තොරව පොහොර ණයට විකුණුම් සිදුකර තිබීම. |
| (ඇ) තොග පාලනය | (i) | තොග ලැබීම් නිකුත් කිරීම්,වර්ග කිරීම් පිළිබඳ අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක නොවීම හා සෙමින් නිකුත් වන හා නිකුත් නොවන, තොග, හානි වූ තොග හඳුනාගැනීමට කටයුතු නොකිරීම. |
| | (ii) | ලිපිද්‍රව්‍ය හා අනෙකුත් තොග සම්බන්ධ අයිතම 52 ක අගය අවසාන තොග ශේෂය හා නොගැලපීම. |
| (ඇ) ගිණුම් පාලනය | (i) | අවදානම් අවම කරගැනීම සඳහා රක්ෂණාවරණ ලබානොගැනීම |
| | (ii) | සුදුසු විද්‍යුත් ගිණුම්කරණ පද්ධතියක් උපයෝගි කර නොගැනීම හේතුවෙන් ගිණුම් ක්‍රමය සංකිර්ණ වීමෙන් ගනුදෙනුවල නිවරදිතාවය තහවුරුකර ගැනීමට නොහැකි වීම. |